ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනපති උපාධි වැඩසටහන
අවසාන පරීක්ෂණය - 2023/2024
STP 9618 - අධ්‍යාපන කළමනාකරණය
කාලය - පැය තුන (03) යි.

දිනය : 2024.08.21 **වේලාව : පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා**

ඕනෑම ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.

01. i.) කළමනාකරණ සංකල්පය පිළිගත් නිර්වචනයක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

ii.) "සැලසුම්කරණය කළමනාකරණ ක්‍රියාවලියේ ආරම්භක සහ ඉතා වැදගත් පියවර වේ" ඔබේ පාසලට/ ආයතනයට අදාළව උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 12)

iii.) ඔබේ පාසලට/ ආයතනයට අදාළව එක් කළමනාකරණ ගැටලුවක් තෝරා ගෙන, එම ගැටලුව විසඳීම සඳහා ක්‍රියාකාරකම් සැලැස්මක් (Action Plan) පිළියෙළ කරන්න. (ලකුණු 13)

02. "ඕනෑම සංවිධානයක සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය හැඩගස්වන තීරණාත්මක සාධකයක් ලෙස නායකත්වය සැලකේ."

i.) නායකත්ව සංකල්පය පිළිගත් නිර්වචනයක් ඇසුරින් පැහැදිරි කරන්න. (ලකුණු 08)

ii.) නායකත්වය සම්බන්ධ ඕනෑම න්‍යායයන් තුනක් (03) සඳහන් කරන්න. ඉන් එක් න්‍යායක් තෝරගෙන, එම න්‍යාය ඵලදායී නායකයකු වීමට ඔබට උපකාරවන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 12)

ii.) 21 වන සියවසේ අධ්‍යාපන නායකයකුට තිබිය යුතු අත්‍යාවශ්‍ය කුසලතා පහක් (05) ලැයිස්තුගත කරන්න. අධ්‍යාපන නායකයකු මෙම කුසලතා සංවර්ධනය කර ගැනීමේ දී මුහුණ දිය හැකි අභියෝග තුනක් (03) ශ්‍රී ලාංකික අධ්‍යාපන සංදර්භයට අදාළව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 13)

03. i.) "සංවිධාන සංස්කෘතිය" යන සංකල්පය පිළිගත් නිර්වචනයක් ඇසුරින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

ii.) සංවිධාන සංස්කෘතියක දක්නට ලැබෙන ගතිලක්ෂණ හතරක් (04) උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

iii.) ආයතනයක සංවිධාන සංස්කෘතිය වැඩි දියුණු කිරීම සඳහා ගත හැකි උපායමාර්ග **දෙකක් (02)** උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

iv.) Edgar Schein's Culture Model යනු සංවිධාන සංස්කෘතිය අවබෝධ කර ගැනීම හා විශ්ලේෂණය කිරීම සඳහා වන රාමුවකි. කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 09)

04. **"ව්‍යාපෘතියක් යනු සීමිත සම්පත් සමූහයක් සහ සීමිත කාල සීමාවක් තුළ අරමුණක් සාක්ෂාත් කර ගැනීම සඳහා කාර්යයන් සම්පූර්ණ කිරීම ඇතුළත් වන උත්සාහයක් ලෙස සරලව අර්ථ දැක්විය හැකිය"**

i.) ව්‍යාපෘති කළමනාකරණය යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 08)

ii.) ඕනෑම ව්‍යාපෘතියක් සාර්ථකව කළමනාකරණය කිරීම සඳහා ඉවහල් වන මාන **තුන (03)** (Dimensions/Triple Constraints) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 12)

iii.) ව්‍යාපෘතියක පාර්ශවකරුවන් යන්නෙන් අදහස් කරන්නේ කවුරුන් ද යන්න සඳහන් කර, ව්‍යාපෘති කළමනාකරණයේදී පාර්ශවකරුවන්ගේ අපේක්ෂණ සලකා බැලිය යුත්තේ ඇයි දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 13)

05. "අධ්‍යාපන කළමනාකරණයේ සහ පරිපාලනයේ ගැටලු ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතියේ සෑම මට්ටමකදීම සිදු වේ."

i.) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතියේ දක්නට ලැබෙන අධ්‍යාපන කළමනාකරණයේ සහ පරිපාලනයේ ගැටලු **හතරක් (04)** සඳහන් කරන්න. (ලකුණු 08)

ii.) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කළමනාකරණයේ සහ පරිපාලනයේ ගැටලු ඇතිවීමට දායක වන සාධක **තුනක් (03)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 12)

iii.) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කළමනාකරණයේ සහ පරිපාලනයේ ගැටලු විසඳීම හෝ අවම කිරීම සඳහා ගත හැකි පියවර **තුනක් (03)** කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 13)

- හිමිකම් ඇවිරිණි. -